**ශීර්ෂය 16 - පාර්ලිමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------

ශීර්ෂය 16 - පාර්ලිමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 14 දින පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

පාර්ලිමේන්තුව සඳහා සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,437.44 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 2,152.55 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 284.89 ක් හෙවත් සියයට 11.69 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත සඳහන් වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,857.45 | 1,816.48 | 40.97 | 2.21 |
| මූලධන | 579.99 | 336.07 | 243.92 | 42.02 |
| **එකතුව** | **2,437.44** | **2,152.55** | **284.89** | **11.69** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

පාර්ලිමේන්තුවට අදාළ විෂය අංක 01601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 38.00 | 24.91 | 28.00 | 31.16 | 175 | 122.33 |

## 2.3 අග්‍රිම ගිණුම්

පාර්ලිමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0120/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 2.7 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

පාර්ලිමේන්තුව යටතේ වූ තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 43.75 ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0088/000 | 42.38 |
| 6000/0000/00/0016/0040/000 | 0.07 |
| 6000/0000/00/0018/0051/000 | 1.30 |
| **එකතුව** | **43.75** |

## 2.5 විගණන නිරීක්ෂණය

පාර්ලිමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පාර්ලිමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි. |
| (ආ) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454 (1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | වාහන ලොග් සටහන් පොත් | මුදල් රෙගුලාසි 1645 (අ) හා 1647 | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2** **විගණන විමසුම්වලට පිළිතුරු දීම**

2015 වර්ෂයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 ක් සඳහා 2017 අගෝස්තු 25 දින වනවිටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.5,132,904 ක් විය.

**3.3** **විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන අයවැය චක්‍රලේඛයේ (2) ඡේදය ප්‍රකාරව, අනිවාර්යෙන් සියයට 15 හා සියයට 10 ක ඉතිරි කිරීම් සිදුකළ යුතු වුවත්, ඉන්ධන හා ප්‍රවාහන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 03 ක් හා සියයට 02 ක් පමණක් ඉතිරිකර තිබුණි.

(ආ) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන අයවැය ඇස්තමේන්තු නොකිරීම නිසා මූලධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය සියයට 34 සිට සියයට 76 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.37,076,274 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

**3.4** **පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.303,196 ක් වූ තැන්පතු 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 01601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්‍රාම ගිය සහ මියගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,066,253 ක් වූ ණය ශේෂය තුළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.414,539 ක ණය ශේෂ, වර්ෂ 12 කට අධික කාලයක සිට අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 16 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.1,238,831 ක් වූ ණය ශේෂය තුළ නිලධාරීන් 11 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.866,732 ක ණය ශේෂ, වර්ෂ 12 සිට වර්ෂ 21 දක්වා කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් ණය වශයෙන් සඳහන් කර තිබුණු, නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.112,290 ක් වූ ණය ශේෂය තුළ 2007 වර්ෂයේ සිට පැවත එන නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.98,540 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කරගෙන නොතිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළයුතු වුවත්, 2016 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 3.6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 සහ 07 ඡේද ප්‍රකාරව වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පූර්ව විමසුමකට භාජනය කර පිළියෙළ කර නොතිබුණි.

(ආ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව, අභ්‍යන්තර විගණන අංශය විසින් වාහන පිරිවැය සම්බන්ධ කාර්තු වාර්තා පිළියෙළ කර නොතිබුණු අතර, වාහන පිරිවැය සම්බන්ධ ආර්ථික බව, ඵලදායීතාවය හා කාර්යක්ෂම බව පිළිබඳ අධ්‍යයනයක් සිදු කර නොතිබුණි.

(ඇ) 2012 ජනවාරි 13 දිනැති අංක ඩීඑම්ඒ/07 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය මගින් පරිගණක තොරතුරු පද්ධතීන්හි අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ සපයා ඇති නමුත්, වැටුප් සකස් කිරීමේ හා ගෙවීමේ සාමාන්‍ය පාලන රෙගුලාසි හා උපක්‍රම, වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය සම්බන්ධ ඇති පාලනයන් හා එම මෘදුකාංගය භාවිතා කිරීමේදී අනුගමනය කරන පාලන ක්‍රම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. තවද උක්ත මාර්ගෝපදේශයේ 11 ඡේදය ප්‍රකාරව, තොරතුරු පද්ධතියේ අඩුපාඩු හා වැටුප් පිළියෙළ කිරීමේදී ආයතන අංශය හා මූල්‍ය

අංශය විසින් සිදුකර තිබුණු සාමාන්‍ය පාලන රෙගුලාසිවලින් බැහැරවීම් පෙන්වාදී, නිවැරදි කිරීමට උපදෙස් ලබාදී නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

පාර්ලිමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### 3.7.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 128 (එ) හි දක්වා ඇති පරිදි මිලදී ගැනීම් සිදු කිරීමේදී, අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන අරපිරිමැසුම්ව, කාර්යක්ෂමව විධිමත් බවින් හා අවංක බව පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වමින් කටයුතු නොකිරීම නිසා, මිලදී ගෙන තිබුණු ටෝනර් කාට්‍රිජ අයිතම වර්ග 26 කින් ඒකක 123 ක්, 2016 පෙබරවාරි 19 දින සිට 2017 මාර්තු 31 දින දක්වා වූ වර්ෂයක කාලයක් තුළදී කිසිදු නිකුත් කිරීමක් සිදු නොකර ගබඩාවේ නිෂ්කාර්යව පැවතුනි. එසේම එම කාලය තුළ සෙමින් චලනය වූ ටෝනර් කාට්‍රිජ අයිතම වර්ග 13 කින් ඒකක 113 ක් ද ඉතිරි වී තිබුණු අතර, කල් ඉකුත් වූ තොගද ඇතුළත් එම අයිතමවලින් සමහර ටෝනර් කාට්‍රිජ් වර්ෂ 10 කට වඩා පැරණි ඒවා විය.

(ආ) ඉහත මුදල් රෙගුලාසිය පරිදි කටයුතු නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළදී රු.3,879,459 ක් වැයකර ටයර් 153 ක්, රිම් 36 ක් හා ටියුබ් 50 ක් මිලදී ගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට පැවති ඉතිරි තොගය සමඟ එකතු කළ විට 2017 අගෝස්තු 17 දින වන විට ගබඩාවේ ඉතිරිව පැවති මුළු තොගයෙහි ටයර් 385 ක්, රිම් 51 ක් සහ ටියුබ් 344 ක් විය. මෙම තොගයෙන් පාවිච්චියට ගත හැකි හා නොහැකි තොග වෙන වෙනම හඳුනා ගෙන නොතිබුණි.

(ඇ) 2016 මැයි 11 දින වෙනත් ආයතනවලට පවරාදී තිබුණු වාහන 02 ක් වෙනුවෙන් 2016 ජුනි 10 දින රු.278,320 ක් වැයකර ටයර් 08 ක් මිලදී ගෙන ගබඩාවේ තබා තිබුණි. එම ටයර් 08 වෙනත් වාහනයක් සඳහා යොදා ගත හැකි බව දන්වා තිබුණු නමුත්, මෙයට අමතරව ගබඩාවේ ටයර් 6 ක් පැවතියදී එම වාහනය සඳහා තවත් ටයර් 4 ක් මිලදී ගෙන තිබුණි. නමුත් 2017 අගෝස්තු 17 දින වන විටත් ගබඩාවේ ටයර් 16 ක් පැවති අතර 2016 වර්ෂයේදී ටයර් 02 ක් පමණක් භාවිතා කර තිබුණි.

(ඇ) වාහන 05 ක් සඳහා ටයර් 44 ක් ගබඩාවේ තිබියදීත්, එම වාහන සඳහා 2016 වර්ෂය තුළදී රු.415,555 ක් වැයකර තවත් ටයර් 28 ක් මිලදී ගෙන තිබුණි. කිසිදු නිකුත් කිරීමකින් තොරව 2017 මාර්තු 22 දින වන විටත් මෙම ටයර් 72 ක තොගය ගබඩාවේ තබා තිබුණි.

### 3.7.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, 2016 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ පවත්වා එම වාර්තා 2017 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. අවසන් වරට 2014 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ සිදුකර තිබුණු අතර, පාර්ලිමේන්තුව සතු වාහන 09 ක් එම භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට ඇතුළත් කර නොතිබුණි.

**3.8** අනුකූල නොවීම්

**-------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| ------------------------------------ | | | ------------ රු. | ------------------ |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** ------------------------------------ | | | |
| | (i) | මුදල් රෙගුලාසි 94 | 17,699,537 | ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැදිය නොහැකි වුවද, සේවාවන් හෝ සැපයුම් නොවන පුනරාවර්තන වැය විෂයයන් 08 ක හා මූලධන වැය විෂයයන් 03 ක ඉතිරිවීම් ඉක්මවා බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 104 (2)(3) | 2,352,254 | සමාලෝචිත වර්ෂය තුළදී සිදුවී තිබුණු රු.50,000 ට වැඩි අලාභ හානි සහිත වාහන අනතුරු 06 ක් සම්බන්ධව භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණු අතර එම අනතුරු 06 ඇතුළු වාහන අනතුරු 19 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක පරීක්ෂණ හෝ පූර්ණ පරීක්ෂණ සිදුකර නොතිබුණි. තවද වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති නිලධාරියෙකු වෙත ලබාදී තිබුණු වාහනයකට එකම ගමන් වාරයකදී හදිසි අනතුරු 02 ක් සිදුවී තිබුණු නමුත් දෙවන අනතුර පිළිබඳ පොලිසියට පැමිණිලි කර නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 755 (1)(2) | | ගබඩා භාරකරුගේ භාණ්ඩ සතු නිලධාරියෙකුගේ භාරය වෙනස් වන අවස්ථාවලදී භෞතික ශේෂය සමඟ තොග ලේඛන සසඳා භාරදීම් හා භාරගැනීම් සිදුකළ යුතු වුවත්, එවැනි සැසඳීමකින් තොරව ටයර් ගබඩාවේ භාරකාරිත්වය 2014 නොවැම්බර් 19 දින සිට වෙනත් ගබඩා භාරකරුවෙකුට භාරදී තිබුණි. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 6 කට වරක් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කළ යුතු වුවත්, වාහන 54 ක සාමාන්‍ය ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |

(ඇ) **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය**

| | |
|---|---|
| 2013 ජනවාරි 24 දිනැති අංක එස්ඒ/ඒඑස් /ඒඒ චක්‍රලේඛය | පාර්ලිමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. |

## 3.9 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා කාර්යසාධන වාර්තා අනුව පාර්ලිමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2016 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා 08 වන පාර්ලිමේන්තුවේ රැස්වීම් 101 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණු නමුත්, ඉන් රැස්වීම් 97 ක් පමණක් පවත්වා තිබුණි. එම රැස්වීම් 97 සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

| සහභාගීවී තිබුණු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | පැවැත්වූ රැස්වීම් ගණන |
|---|---|
| 51 සිට 75 දක්වා | 01 |
| 76 සිට 100 දක්වා | 01 |
| 101 සිට 125 දක්වා | 13 |
| 126 සිට 150 දක්වා | 21 |
| 151 සිට 175 දක්වා | 45 |
| 176 සිට 200 දක්වා | 11 |
| 201 සිට 225 දක්වා | 05 |
| | 97 |

ඉහත සඳහන් තොරතුරු අනුව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 න් 150 කට වඩා වැඩියෙන් සහභාගී වී තිබුණු රැස්වීම් 61 ක් පමණක් විය. එසේම සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණු මුළු රැස්වීම් 97 න් 36 ක් සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 150 කට වඩා අඩුවෙන් සහභාගීවී තිබුණි. තවද ගරු මන්ත්‍රීවරුන් 200 කට වඩා වැඩියෙන් සහභාගීවී තිබුණේ රැස්වීම් දින 5 කට පමණක් බවත් නිරීක්ෂණය විය.

(ආ) ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් පාර්ලිමේන්තු වැය ශීර්ෂය හා පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ වර්ෂ 05 ක් තුළදී වැය කර තිබුණු වැටුප්, වේතන, දීමනා, කාර්ය මණ්ඩල වියදම්, ප්‍රවාහන හා ඉන්ධන, ලිපි ද්‍රව්‍ය, ගමන් වියදම්, ආහාර පාන, කාර්යාල නඩත්තු වියදම්, තැපැල් හා සන්නිවේදන, විදුලිය හා වෙනත් ආදී වූ වියදම් පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| **වර්ෂය** | **ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් පාර්ලිමේන්තු වැය ශීර්ෂය යටතේ වැයකර තිබුණු වියදම** | **ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වැයකර තිබුණු වියදම** | **ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් වැයකර තිබුණු මුළු වාර්ෂික වියදම** |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2012 | 7,274,416 | 84,992 | 7,359,408 |
| 2013 | 7,148,661 | 85,142 | 7,233,803 |
| 2014 | 7,396,104 | 93,807 | 7,489,911 |
| 2015 | 7,596,424 | 141,684 | 7,738,108 |
| 2016 | 8,369,516 | 205,888 | 8,575,404 |

(ඇ) ගරු අමාත්‍යවරයෙකු වෙනුවෙන් පාර්ලිමේන්තු වැය ශීර්ෂය යටතේද, අදාළ අමාත්‍යාංශ ශීර්ෂයන් හා පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වැය ශිර්ෂය යටතේද, 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ වර්ෂ 05 ක් තුළදී වැය කර තිබුණු වැටුප්, වේතන, දීමනා, කාර්ය මණ්ඩල වියදම්, ප්‍රවාහන හා ඉන්ධන, ලිපි ද්‍රව්‍ය, ගමන් වියදම්, ආහාර පාන, කාර්යාල නඩත්තු වියදම්, තැපැල් හා සන්නිවේදන, විදුලිය හා වෙනත් ආදී වූ වියදම් පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| **වර්ෂය** | **ගරු අමාත්‍යවරයෙකු වෙනුවෙන් පාර්ලිමේන්තු වැය ශීර්ෂය යටතේ වැයකර තිබුණු වියදම** | **ගරු අමාත්‍යවරයෙකු වෙනුවෙන් එක් එක් අමාත්‍යාංශවල වැය ශීර්ෂ යටතේ වැයකර තිබුණු වියදම** | **ගරු අමාත්‍යවරයෙකු වෙනුවෙන් පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වැයකර තිබුණු වියදම** | **ගරු අමාත්‍යවරයෙකු වෙනුවෙන් වැයකර තිබුණු මුළු වාර්ෂික වියදම** |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| 2012 | 6,574,422 | 23,906,640 | 84,992 | 30,566,054 |
| 2013 | 6,420,765 | 26,490,607 | 85,142 | 32,996,514 |
| 2014 | 6,674,847 | 27,737,350 | 93,807 | 34,506,004 |
| 2015 | 7,054,526 | 25,506,983 | 141,684 | 32,703,193 |
| 2016 | 7,628,794 | 29,443,175 | 205,888 | 37,277,857 |

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හා ගරු අමාත්‍යවරයෙකු වෙනුවෙන් පාර්ලිමේන්තු වැය ශීර්ෂය යටතේ වැයකර ඇති වියදම් පිළිබඳව පමණක් එකඟ විය හැකි බවටත්, වෙනත් ආයතනවල වියදම් පාර්ලිමේන්තු වැය ශීර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාවට ඇතුළත් කිරීම සඳහා එකඟවිය නොහැකි බවටත් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් අදහස් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තු රැස්වීම් දින 97 ක් පවත්වා තිබුණු අතර, පනත් කෙටුම්පත් කාර්යාංශය වෙත ලැබුණු රජයේ පනත් කෙටුම්පත් ගැසට්පත්‍ර 30 කින්, පනත් 24 ක් පමණක් සම්මත කර තිබුණි.

### 3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

-----------------------------------

පාර්ලිමේන්තුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව පහත නිරීක්ෂණය කරනු ලැබේ.

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාසය සඳහා පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව, 2016 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය රු.876,886 ක් විය යුතු නමුත්, 2016 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව බැංකු ශේෂය රු.157,995 ක් විය. මෙම රු.718,891 ක් වූ අවාසිදායක ශේෂයට හේතු හඳුනා ගෙන තිබුණු නමුත්, එම ශේෂය නිවැරදි කිරීමට 2017 ඔක්තෝබර් 23 දින වන විටත් කටයුතු කර නොතිබුණි. බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවෙහි තිබිය යුතු ශේෂයෙන් රු.718,891 ක් අඩුකර දක්වා තිබුණි.

### 3.11 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

-----------------------------------------

2014 වර්ෂයේදී එකතුව රු.1,827,100 ක් හා 2015 වර්ෂයේදී එකතුව රු.1,783,665 ක් වැයකර ඉන්ධන ඇතුළු විවිධ භාණ්ඩ හා සේවා මිලදී ගෙන තිබුණු ආයතනයකින් 2016 වර්ෂයේදිද එකතුව රු.1,761,714 ක ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ, විදුලි උපකරණ හා ගොඩනැගිලි ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ මිලදී ගෙන තිබුණි. සැපයුම්කරු ඉදිරිපත් කර තිබුණු ලිපිනයෙහි ඉහත සඳහන් භාණ්ඩ හා සේවා සපයන ව්‍යාපාරික ස්ථානයක් නොපැවති බවත්, එකම ලිපිනයක්, එකම දුරකථන අංක හා ෆැක්ස් අංක සහිත ව්‍යාපාරික නාම 02 කින් පෙනී සිට ලිපි ශීර්ෂ 03 ක් භාවිතා කර ගනුදෙනු කරන ස්ථානයක් බවත් සිදුකරන ලද විගණනයේදී නිරීක්ෂණය විය.

### 3.12 පාඩු හා හානි

---------------

ඉකුත් වර්ෂ 3 කදී සිදුවී තිබුණු වාහන අනතුරු 71 ක් අතරින් නියැදියක් ලෙස තෝරාගත් අනතුරු 35 කින් සිදුව තිබුණු හානිවල වටිනාකම රු.2,316,559 ක් වූ අතර ඉන් රු.2,261,614 ක් පමණක් රක්ෂණ සමාගම්වලින් ප්‍රතිපූර්ණය කර තිබුණු බැවින්, සිදුවී තිබුණු අලාභය රු.54,945 ක් විය.

### 3.13 විසඳා නොතිබුණු විගණන ඡේද

----------------------------------

පාර්ලිමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වර්ෂය | ඡේද අංකය | යොමුගත විෂයය |
|---|---|---|
| -------- | -------------- | ------------------- |
| 2015 | 3.2 (අ) | අනුමත බඳවා ගැනීමේ පරිපාටිය සහ උසස් කිරීමේ පරිපාටිය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම. |
| 2015 | 3.2 (ආ) | පාර්ලිමේන්තු සංකීර්ණයේ ප්‍රධාන ගොඩනැගිල්ල, කථානායකතුමාගේ නිල නිවස, මාදිවෙල නිවාස සංකීර්ණය සහ ජයවඩනගම කාර්ය මණ්ඩල නිවාස පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබීම. |
| 2015 | 5.3 (අ) (v) | 2008 මැයි 02 දිනැති අංක ඩීඑම්එස්/සී/4/පී/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම නොපමාව ක්‍රියාත්මක කළ යුතු බව දක්වා ඇතත්, එසේ කටයුතු කර නොතිබීම. |
| 2013 | 1.6 (අ) (i) | අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා නොගෙන වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 10 ක් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ලබාදී තිබීම. |

## 3.14 කළමනාකරණ දුර්වලතා

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සැපයුම් අංශයේ ගබඩාවට හඳුන්වා දී තිබුණු මෘදුකාංගය, 2017 අගෝස්තු 25 දින දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. දෛනික ලැබීම් හා නිකුත් කිරීම් විශාල ප්‍රමාණයක් සිදුවන මෙම ගබඩාව තුළ පවත්වා තිබුණු පාරිභෝජන ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතරම ඒවායේ පිරිවැය ගණනය කිරීමේ හැකියාවක් ද නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.5 වගන්තිය ප්‍රකාරව යම් නිලධාරියෙකුගේ පඩි ලැයිස්තුවෙන් මාසික අඩුකිරීම්වල එකතුව වැටුපෙන් සියයට 40 කට වැඩි නොවිය යුතු වුවත්, ඒ පිළිබඳව සැලකිලිමත් නොවී හා ණය වාරික වැටුපෙන් අඩුකිරීම සඳහා සේවකයින්ගේ කැමැත්ත නොවිමසා, සුභ සාධක සංගම් 02 ක් විසින් නිලධාරීන් 155 දෙනෙකුගේ මාසික වැටුපෙන් සියයට 40 සීමාව ඉක්මවා ණය වාරික අඩුකර තිබුණි.

**3.15** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 54 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 162 | 142 | 20 |
| (iii) | ද්විතියික මට්ටම | 236 | 190 | 46 |
| (iv) | ප්‍රාථමික | 474 | 440 | 34 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 02 | 01 |
| | එකතුව | 931 | 828 | 103 |

පාර්ලිමේන්තුවේ සියලුම තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටි සහ උසස් කිරීමේ පටිපාටි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.